# ප්‍රධාන ලේකම් කාර්යාලය-වයඹ

## භාවිතා කරන ලද වාහන හා වාහන සුන්බුන් විකිණීම සඳහා මිල ගණන් කැඳවීම.

01.වයඹ පළාත් සභාවට අයත් ආයතනවල භාවිතා කරන ලද වාහන හා වාහන සුන්බුන් විවෘත ලංසු මගින් විකුණා දැමීම පිණිස මිල ගණන් කැඳවනු ලැබේ. ඊට අදාල සියලු තොරතුරු ප්‍රධාන ලේකම් කාර්යාලයේ www.cs.nw.gov.lk වෙබ් අඩවියෙන් ලබාගත හැක.

**I කාණ්ඩය- සුන්බුන් වශයෙන් විකිණීමට හඳුනාගන්නා ලද වාහන**

මේ යටතේ වාහන 06ක් විකිණීමට ඇති අතර එම වාහනවල වැසි අංක ඉවත් කර ලියාපදිංචිය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙතින් අවලංගු කිරීමට කටයුතු කර ඇත.මෙම වාහනවල ලියාපදිංචි සහතික ලබා දෙනු නොලැබේ.

**II කාණ්ඩය - ලියාපදිංචි රථ ලෙස විකිණීම සඳහා හඳුනාගන්නා ලද වාහන**

මේ යටතේ වාහන 14ක් විකිණීමට ඉදිරිපත් කර ඇති අතර එය කාර් 04ක්, වෑන් රථ 03ක්, ජීප් රථ 02ක්, ලොරි රථ 02ක්, කැබ් රථයක්, බවුසරයක් හා ත්‍රිරෝද රථයකින් සමන්විත වේ.

02. විකිණීමට නියමිත වාහන **2026.09.11** දින සිට **2026.10.12** දක්වා කාර්යාල දිනයන්හි **පෙ.ව 9.00 සිට ප.ව.3.00** දක්වා පරික්ෂා කර බැලිය හැකිය.

03. ගෙවිය යුතු ගාස්තු

| | **එක් වාහනයක් සඳහා (රු)** | **එක් සුන්බුන් වාහනයක් සඳහා (රු)** |
|---|---|---|
| ආපසු ගෙවනු ලබන තැන්පතු මුදල් | 50,000.00 | 25,000.00 |
| ආපසු ගෙවනු නොලබන ටෙන්ඩර් ලේඛන ගාස්තු මුදල් | 3,000.00 | 3,000.00 |

04. **2026.09.11** දින සිට **2026.10.12** දින දක්වා කාර්යාල දිනයන්හි **පෙ.ව 9.00 සිට ප.ව.3.00** දක්වා ප්‍රධාන ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයෙන් (විදුසර දොරටුව, දෙවන මහල) අදාල ගෙවීම් සිදුකර විස්තර පත්‍රිකාව සහ ලංසු ලේඛන ලබා ගත හැකි අතර **එක් ලංසු ලේඛණයකින් එක් වාහනයක්/එක් සුන්බුන් වාහනයක් සඳහා පමණක් මිල ගණන් ඉදිරිපත් කල යුතුය.**

05. එක් එක් වාහනය/සුන්බුන් වාහනය සඳහා වෙන වෙනම ලංසු ලියවිලි ඉදිරිපත් කල යුතු අතර නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි, මුල් පිටපත හා අනු පිටපත වශයෙන් වෙන් වෙන්ව කවර වල වාහන අංකයද සමඟ සඳහන් කර මුද්‍රා තබා ඉන් පසුව ඒවා එක් ලියුම් කවරයක බහා කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"අංක .................. (වාහනයේ අංකය/ලොට් අංකය) දරණ භාවිතා කරන ලද වාහන හා වාහන සුන්බුන් විකිණීම සඳහා මිල ගණන් කැඳවීම-2026 "** යනුවෙන් සඳහන් කර **2026.10.13 දින පෙ.ව. 10.00** ට **පෙර සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ප්‍රධාන ලේකම් කාර්යාලය(වයඹ),ගිණුම් අංශය (විදුසර දොරටුව,දෙවන මහල), වයඹ පළාත් සභා කාර්යාල සංකීර්ණය,**කුරුණෑගල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ප්‍රධාන ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ තබා ඇති ලංසු පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම සිදු කල හැකිය.

06. **2026.10.13** දින **පෙ.ව 10.00**ට ලංසු භාරගැනීම අවසන් වන අතර වහාම ලංසු පෙට්ටිය මුද්‍රා තැබේ.ඒ සමඟම වයඹ පළාත් සභා කාර්යාල සංකීර්ණයේ **"ලිච්ඡවි ශාලාවේදී"** ලංසු මිල ගණන් විවෘත කරනු ලබන අතර, ඒ සඳහා ලංසුකරුට සහභාගි විය හැකි අතර යම් හෙයකින් ලංසුකරු සහභාගි නොවන්නේ නම් පමණක් ඒ වෙනුවට එක් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

07.මේ පිළිබඳ වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම් ප්‍රධාන ලේකම් කාර්යාලය 037-2222234 යන දුරකථන අංකයට අමතන්න.

**අයි.එම්.අයි.ඉලංගකෝන්**
**ප්‍රධාන ලේකම්,**
**වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලය,**
**වයඹ පළාත් සභා කාර්යාල සංකීර්ණය,**
**කුරුණෑගල.**